**සීමාසහිත සීනෝර් පදනම - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත සීනෝර් පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව සංචලනය නොවන හා හානි වූ තොග පිළිවෙලින් රු.4,031,914 ක් හා රු.115,097 ක් ලෙස එකතුව රු.4,147,012 ක් සම්බන්ධයෙන් හානිකරණය සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | සංචලන නොවන තොග ලෙස පැවතියද නැවත විකුණුම් මට්ටමෙන් හා පරිහරණය කල හැකි මට්ටමේ පවතින බැවින් ඒ සඳහා හානිකරන වෙන් කිරීමක් නොකරන ලදි. | ප්‍රමිතය ප්‍රකාරව සංචලනය නොවන හා හානි වූ තොග සම්බන්ධයෙන් හානිකරණය සඳහා වෙන් කිරීම් සිදු කළ යුතුය. |
| (ආ) | වසර 10 කට වැඩි කාලයක සිට ජංගම වත්කම් යටතේ පෞද්ගලික සමාගමක් නමින් දක්වා තිබෙන රු.9,204,498 ක ශේෂය වෙනුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ වාර්තාකරණ ප්‍රමිති 9 හි 5.5 ඡේදය ප්‍රකාරව හානිකරණ අලාභ හඳුනාගෙන නොතිබුණි. | නොලැබුණු ශේෂ සම්බන්ධ අඩමාන ණය වෙන්කිරිමක් සිදු කිරිමට කටයුතු කිරිමට උපදෙස් ලබා දි ඇත. | ප්‍රමිතය ප්‍රකාරව දිගුකාලයක් පැවති මෙම ශේෂය සඳහා හානිකරණ අලාභ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | රු.1,961,850 ක් වූ ශ්‍රී බංග්ලාස් බෝට්ටි බද්ධ ව්‍යාපාරය සමඟ 2014 වර්ෂයේ දී නිර්මාණය කර තිබූ බෝට්ටු අච්චුව ජංගම නොවන වත්කම් යටතේ සහ වෙනත් ගෙවිය යුතු ශේෂය තුළ හානිකරණ අලාභ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ගිණුම්ගත කර තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36 හි 126 ඡේදය ප්‍රකාර හානිකරණයට යටත් වූ වත්කම්වල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හෙළිදරව් කළයුතු වුවත් එසේ දක්වා නොතිබුණු බැවින්, ආයෝජන ලෙස දක්වා තිබුණු ශ්‍රී බංග්ලාස් බෝට්ටු අච්චුවල අගය වැඩියෙන් පෙන්නුම් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශ තුළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 අනුව මූල්‍ය ප්‍රකාශණවල හෙළිදරව් කිරිමට උපදෙස් ලබා දි ඇත. | ප්‍රමිතය ප්‍රකාරව හානිකරණයට යටත් වූ වත්කම්වල ධාරන අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) | කරෙයිනගර් බෝට්ටු යාත්‍රාංගනයේ බෝට්ටු දියත් කිරීමට සකස්කර ඇති පාර (slipasay) සෝදායාම වැලැක්වීමට සකසා ඇති බැම්ම සහ එයට උඩින් සකසා ඇති දැල් වැට (Gabain wall chain link fence) හා බෝට්ටු නවතා තැබීමට සකස් කර ඇති ස්ථානය (Boat Anchoring) යන අයිතමයන්ට අදාළ වටිනාකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ බැවින් දේපල පිරියත උපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. ශ්‍රී ලංකා | කරෙයිනගර් බෝට්ටු යාත්‍රාගනයේ Dredging work , Slipway ,Gabian wall chain link Fence සහ Boat Anchoring යන අයිතමයන් අප වෙත ඉදිකිරිම් නිමකර භාරදුන් දින වන 2018.10.10 වන විට වටිනාකම හඳුනාගෙන අප වෙත ඉදිරිපත් නොවූ අතර, අද වන විට එය අප වෙත ලැබී ඇත. ඒ අනුව 2023 ගිණුම තුළ අදාල නිවැරදි කිරිමට කටයුතු කළ බව දැනුම් දෙමි. | ප්‍රමිතය ප්‍රකාරව එම අයිතමවල වටිනාකම නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

ගිණුම්කරණ ප්‍රමිත 16 හි 07 ඡේදය ප්‍රකාරව ඉහත දක්වන ලද අයිතම ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්ථිත්වය වෙත ගලා ඒමේ නම්‍යතාවයක් ඇති බැවින් අදාළ ප්‍රමිතීන් ප්‍රකාරව එම අයිතමවල වටිනාකම නිවැරදිව තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට රු.39,830,681ක් වූ වෙළඳ ණයගැති ශේෂය තුල එකතුව රු.300,122 ක ණයගැතියන් 19 දෙනෙකුගේ ඍණ ශේෂ හිලව් කර තිබුණු බැවින් වෙළඳ ණයගැති ශේෂය රු.300,122 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි. | ණය ගැතියන්ගෙන් ලැබී තිබූ අත්තිකාරම් මුදල් ණය ගිණුමෙන් ඉවත්කර, ණයගැති අත්තිකාරම් මුදල් ලැබීම් ගිණුමට මාරුකර 2023 වර්ෂය සිට පවත්වාගෙන යාමට කටයුතු කරයි. | ණයගැති ශේෂය සහ ණයගැති ඍණ ශේෂ හිලව් නොකළ යුතුය. |
| (ආ) | අඩමාණ ණය වෙන්කිරීම් උපලේඛනයට අනුව පෞද්ගලික නමකින් රු.238,822 ක අඩමාණ ණය වෙන්කිරීමක් සිදුකර තිබුණු නමුත්, ණයගැති උපලේඛනය අනුව එවැනි නමකට අදාළව අයවීමට ණය ශේෂයක් නොතිබුණි. | 2023 ගිණුම්වල අවශ්‍ය ගිණුම්කරණමය ගැලපීම සිදුකරමින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | අඩමාණ ණය වෙන්කිරීම නිවැරදිව කළ යුතුය. |
| (ඇ) | 2008 හා 2014 වර්ෂවල සිට ගණුදෙනු කිරිමක් නොමැති හා අයකර ගැනීමට නොහැකි වූ එකතුව රු.345,413 ක්වූ ණය ශේෂ තුනක් සඳහා අඩමාණ ණය වෙන්කර නොතිබුණි. | පැරණි නොලැබුණු ශේෂ සම්බන්ධ අඩමාන ණය වෙන්කිරිමක් සිදු කිරිමට කටයුතු කිරිමට උපදෙස් ලබා දි ඇත. | අයකර ගැනීමට නොහැකි ණය ශේෂ සම්බන්ධයන් අඩමාණ ණය වෙන්කිරීම් සිදුකළ යුතුය. |
| (ඈ) | 2018 සිට 2021 දක්වා කාලපරිච්ඡේදයට අදාළව ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කර තිබෙන බිල්පත්‍රවලට අනුව ගෙවිය යුතු විගණන ගාස්තුවල එකතුව රු.1,656,000 ක් වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස රු.971,100 ක් වෙළඳ ණයහිමි ගිණුමේ දක්වා තිබීම හේතුවෙන් ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු රු.684,900 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | ජාතික විගණන කාර්යාලය වෙත ගෙවිය යුතු විගණන ගාස්තු වෙළඳ ණය හිමි ගිණුමෙන් වෙන් කර විගණන ගාස්තු ගෙවීමේ ගිණුමට මාරු කිරිම 2023 මුල්‍ය ගිණුම් තුළ නිවැරදි කිරිමට උපදෙස් ලබා දී ඇත. | ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ණයගැති ලෙජරයට අනුව වසර 06 කට වඩා පැරණි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා ණයගැති ශේෂය රු.3,022,909 ක් වුවද, සීනෝර් පදනමට ගෙවිය යුතු ශේෂයක් නොමැති බව 2021 මාර්තු 31 දින ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් සනාථ කර තිබුණු අතර මෙම සංස්ථාව සමඟ සමාලෝචිත වර්ෂයේ දී සහ ඊට පෙර වර්ෂයේ දී කිසිදු ගණුදෙනුවක් සිදු වී නොතිබුණු බව විගණනයේ දී නිරීක්ෂණය විය. මේ අනුව මෙම ශේෂයන්ගේ වෙනස්කම් පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට පදනම විසින් කටයුතු කර නොතිබුණි. | අප විසින් කිහිපවිටක් Ceylon Harbors Cooperation ආයතනය සමඟ සාකච්චා කලද ප්‍රමාණවත් පිළිතුරක් නොලැබුණු අතර ඉදිරියේ අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කිරීම සහ අවශ්‍ය ගිණුම්කරණමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත. | ශේෂයන්ගේ වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | මට්ටක්කුලිය බෝට්ටු අංගනයෙහි විකුණුම් පිරිවැය ගණනයේ දී සමාලෝචිත වර්ෂයේ ආරම්භක නිම කරන ලද භාණ්ඩ තොගයෙහි වටිනාකම රු.4,732,169 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 04 හි දක්වා තිබුණ ද, 2021 වර්ෂ අවසාන නිම කරන ලද එම භාණ්ඩ තොගයෙහි අගය රු.7,522,045 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබීම නිසා රු 2,789,876 ක වෙනසක් විය. | එකඟ වෙමි. | වර්ෂ අවසාන තොග ශේෂ වටිනාකම ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන යාමේ දී නිවැරදිව සිදුකළ යුතුය. |
| (උ) | 2022 දෙසැම්බර් 31 දින අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ පෙන්නුම් කර තිබෙන රු.3,712,826 ක්වූ ආර්ථික සේවා ගාස්තු සෘණ ශේෂය, 2007 වර්ෂයේ සිට පැවත එන ශේෂයක් වන අතර ගෙවිය යුතු ආදායම් බදු සඳහා හිලව් කිරීමේ කාලය ඉක්මවා ගොස් තිබුණ ද, ගැලපුම් නොකිරීම නිසා අනෙකුත් ගෙවිය යුතු දෑ (other payable) සහ රඳවාගත් අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු රු.3,712,826.15 පැවතිය ද අප ආයතනය 2018, 2019, 2020 ,2022 අලාභ තත්වයේ පැවතුනි. එම නිසා අදායම් බදු ගෙවීමක් සිදු නොවූ බැවින් ඉහත ශේෂය එලෙසම පැවතුනි. ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් තහවුරුවක් ලබාගෙන ආදායම් බදු සමග හිලව් කිරීමට නොහැකි නම් එම ශේෂය 2023 මූල්‍ය ගිණුම් තුළ ඉවත් කිරීමට උපදෙස් ලබා දී ඇත. | හිලව් කිරීමේ කාලය ඉක්මවා තිබූ ගණුදෙනුවල නිවැරදිතාවය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |
| (ඌ) | 2022 දෙසැම්බර් 31 දින අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ පෙන්නුම් කර තිබෙන ජාතිය ගොඩනැගීමේ බදු රු.10,406,699 ක්වූ ශේෂයෙහි නිවැරදිතාවය විගණනයේ දී තහවුරු කරගැනීමට නොහැකි විය. | ජාතික ගොඩනැගීමේ බද්දේ පවතින රු.10,406,694 ශේෂය 2014 වර්ෂයේ සිට පැවත එන පැරණි ශේෂයක් වන අතර 2023 මූල්‍ය ප්‍රකාශන තුළ නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇත. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | රු.4,119,056 ක්වූ රඳවා ගැනීමේ බදු ශේෂය සනාථ කරගැනීම සඳහා පදනම සතුව බදු සහතික නොතිබූ අතර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව මගින් මෙම බදු මුදල් ආපසු ලබාගැනීම අවිනිශ්චිත තත්ත්වයේ වූ බැවින් මෙම ශේෂය නිරවුල් කර ගිණුම්වලට ගලපා නොතිබුණි. | රදවා ගැනිමේ බදු ශේෂය වන රු.4,119,055 ක මුදල දේශිය අදායම් දෙපාර්තමේනතුවෙන් විමසිමක් කර 2023 මූල්‍ය ගිණුම් තුල නිවැරදි කිරිමට උපදෙස් ලබා දි ඇත. | අවිනිශ්චිත තත්ත්වයේ පවතින ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයට අදාල සේවක ප්‍රතිලාභ වෙන්කිරීම රු.2,819,590 ක් වියදම් ලෙස හා සේවක ප්‍රතිලාභ වෙන්කිරීම් ගණනය කිරීමේදී ඇතිවී තිබූ අධි වෙන්කිරීම් මුදල වූ රු.6,493,050 ක් ආදායම් ලෙස ගිණුම්ගත කළ යුතුව තිබුණ ද එම වටිනාකම්වල වෙනස වූ රු.3,673,460 ක මුදල විකුණුම් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව වියදම රු.2,819,590 කින් අඩුවෙන් සහ විකුණුම් රු.3,673,460 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම්කරණයට අවශ්‍ය ගැලපීම 2023 වසරේ සිට නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. | ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුමේ දක්වා තිබෙන වසර 08 කට පෙර ශේෂ තුලනය කිරීම සඳහා ඇතුළත් කරන ලද බැර ශේෂය වූ රු.19,563,024 ක ශේෂය හා රු.72,605,907 ක රඳවාගත් අලාභ ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබූ ආකාරයෙහි නිවැරදිතාවය විගණනයට තහවුරු නොවීය. | 2023 ගිණුම්වල නිවැරදි කිරිම් සිදුකර ඇත. | ශේෂ තුලනය කිරීමට යොදාගත් ශේෂවල නිවැරදිතාවය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුය. |
| (ඕ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේ දී ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලැබිය යුතු පොලීය ද ඇතුළත්ව කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ රු.18,390,303 ක සෘණ ශේෂය සහ කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ රු.7,852,782 ක සෘණ ශේෂ ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත් ඒවා පිළිවෙලින් රු.18,350,605 ක සහ රු.7,703,509 ක සෘණ ශේෂ විය යුතු බව විගණනයේ දී නිරීක්ෂණය කෙරේ. ඒ අනුව කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ රු.39,698 ක් සහ කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ රු.149,273 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | ලැබිය යුතු ශේෂ නිවැරදිව හඳුනාගත යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂයය | | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | අත්තිකාරම් ශේෂය | 26,169,490 | 26,078,089 | 91,401 | අත්තිකාරම් ගිණුම් සැසඳුම් කර 2023 මූල්‍ය ප්‍රකාශණය තුළ නිවැරදි කිරිමට උපදෙස් ලබා දි ඇත. | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ අනුරූපී වාර්තා අතර පවතින වෙනස්කම් හදුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |
| (ආ) | අංක 0331001417900965 දරන බැංකු ගිණුම | 177,182 | 1,760,732 | 1,583,550 | මූල්‍ය ගිණුම තුල එය නිසියාකාරව ගිණුම් ගත කර ඇති බවද තවදුරටත් සොයා බලා කරුණු නිවැරදි කිරිමට උපදෙස් ලබා දි ඇත. | |
| (ඇ) | ස්ථාවර තැන්පතු පොලිය | 1,429,394 | 1,872,753 | 443,359 | තැන්පතු අලුත්කිරිමේ නිවේදන හා බැංකු නිලධාරිනිය ගේද තහවුරුවක් ලබා ගෙන නිවැරදිව පොළි ගණනය කිරිමක් කර ඇත. | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ඇ) | ස්ථාවර තැන්පතු ශේෂය | 16,240,545 | 16,868,043 | 627,497 | තැන්පතු අලුත්කිරිමේ නිවේදන හා අදාළ බැංකුවෙන් තහවුරුවක් ලබා ගෙන නිවැරදිව පොළි ගණනය කිරිමක් කර ඇත. | |
| (ඉ) | දේපල පිරියත උපකරණ | 1,082,023,061 | 1,081,418,124 | 604,937 | මෙම වෙනස දිර්ඝ කාලින ලෙස පැවත එන අතර 2023 වර්ෂයේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව දැන්විමට කැමැත්තෙමි. | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය සහ අනුරූපී වාර්තා අතර පවතින වෙනස්කම් හදුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතුය. |
| (ඊ) | දැල් හා ධීවර ආම්පන්න | 4,199,486 | 4,155,222 | 44,264 | මුල්‍ය ගිණුම තුල එය නිසියාකාරව ගිණුම් ගත කර ඇති බවද තවදුරටත් සෙ◌ායා බලා කරුණු නිවැරදි කිරිමට උපදෙස් ලබා දි ඇත. | |
| (උ) | කුලී ආදායම | 13,906,703 | 13,700,000 | 206,703 | මට්ටක්කුලි කුලී ආදායම නැවත පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත. | |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මුදල<br>රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | සේවක ණය | 3,556,365 | සේවක ණය ලේඛනය | එකග වෙමි | සේවකයින්ට ණය දීම, ණය අයවීම සහ ශේෂ ඇතුළත් සේවක ණය ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ආ) | බැංකු ගිණුම් අංක 002010016031 සහ 090010002143 | 599,167 | බැංකු ප්‍රකාශන, ශේෂ තහවුරු ලිපි | එකඟ වෙමි | විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදීම සිදුකළ යුතුය. |
| (ඇ) | වැටුප් පාලන ගිණුම | 603,785 | විස්තරාත්මක උපලේඛනය | එකග වෙමි | |
| (ඈ) | විකුණුම් අත්තිකාරම් | 38,942,213 | විස්තරාත්මක උපලේඛනය | එකග වෙමි | |
| (ඉ) | ස්ථාවර තැන්පතු | 15,038,010 | අලුත්කිරීමේ නිවේදන | ස්ථාවර තැන්පතු අලුත් කිරිමේ නිවේදන කිහිපයක අඩුවක් පවතින අතර ඉදිරියේ නිවැරදි පරිදි නිවේදන අප වෙත ලබා ගැනීමට කටයුතු කර ඇත. | |
| (උ) | එකතු කළ අගය මත බදු | (19,042,001) | ලෙජර් ගිණුම් හා උපලේඛන | එකතු කල අගය මත බදු මුදල් ශේෂය වන රු.(19,042,001) ක මුදල පිළිබඳව දේශිය අදායම් දෙපාර්තමේන්තු වෙන් විමසිමක් කර 2023 මුල්‍ය ගිණුම් තුල නිවැරදි කිරිමට උපදෙස් ලබා දි ඇත. | විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදීම සිදුකළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඖ) | ලැබිය යුතු බැංකු සුරැකුම් | 4,423,939 | බැංකු සුරැකුම් ලිපි හෝ ශේෂ සනාථන | ගිණුම් ශේෂය ලබා ගැනීම, ගිණුම් ප්‍රකාශ ලබා ගැනීමට අදාළ අනුමත අත්සන් සහිත නිලධාරින් සේවයෙන් ඉවත් වි ගොස් ඇති අතර නව නිලධාරි පත්වීම් සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ යාවත්කාලීන කිරිම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනිමින් පවති. ගිණුම් විස්තර ලබාගැනිමෙන් පසු 2023 මූල්‍ය ප්‍රකාශනයක් තුළ නිවැරදි කිරිමට උපදෙස් ලබා දී ඇත. | ශේෂ සනාථන ඉදිරිපත් කළ යුතුය. |
| (ඵ) | ණයගැතියෝ | 13,046,567 | ශේෂ සනාථන | එකඟ වෙමි. | |
| (ඒ) | සේවක ණය පොලිය | 393,100 | ණය පොලිය ගණනය කිරීමේ උපලේඛනය | ණය ලේඛනය Excel Sheet එකක පවත්වාගෙන යනු ලබන අතර, එමගින් ඕනෑම කෙනෙකුගේ ඕනෑම දිනයකට අදාල අය විය යුතු ශේෂය දැන ගැනිමට හැකියාව පවති. තවද, Payroll පද්ධතිය මගින්ද සියලු විස්තර සමගින් දැන ගැනිමට හැකියාව පවති. | ණය පොලිය ගණනය කිරීමේ ලේඛන පිළියෙල කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ද්‍රව්‍ය අත්තිකාරම් සඳහා ගෙවීම රු.115,463 ක්, අනෙකුත් ලැබීම් එකතුව රු.1,874,584 ක් සහ ආපසු ලැබිය යුතු තැන්පතු රු.580,112 ක ශේෂ සම්බන්ධයෙන් කිසිදු ලිඛිතමය සාක්ෂියක් පදනම සතුව නොතිබුණි. දීර්ඝ කාලයක සිට පැවත එන මෙම ශේෂ අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ විය. තව ද මෙම ශේෂ වෙනුවෙන් අඩමාණ ණය වෙන්කිරීමක් ද සිදුකර නොතිබුණි. | මෙම අයවීම් නැවත අය කර ගැනීමට අදාළව සැපයුම් කරුවන් වෙත සිහිකැඳවීම් නිකුත් කර ඇති අතර දුරකථන මහින්ද සැපයුම් අංශ නිළධාරීන් විසින් අදාළ පාර්ශවයන්ගෙන් අත්තිකාරම් පියවීමට අදාළ ලිපි ලබා දෙන මෙන් ඉල්ලීම් සිදු කර ඇත. අනෙකුත් ලැබීය යුතු රු.1,874,584 ක ශේෂය සහ ද්‍රව්‍ය අත්තිකාරම් ලැබීම් රු.115,463ක ශේෂය සඳහා 2023 මූල්‍ය ප්‍රකාශණය තුළ අඩමාන ණය වෙන්කිරිමක් කිරිමට කටයුතු කරයි. | දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කිසිදු සුරක්ෂණයක් ලබාගැනීමක් හෝ ගිවිසුමකට හෝ එළඹීමකින් තොරව උප කොන්ත්‍රාත් පදනම යටතේ පුද්ගලික ආයතනයකට මාළු දැල් නිපදවීමට රු.5,059,049 ක් වටිනා අමුද්‍රව්‍ය 2011 වර්ෂයේ දී ලබාදී තිබුණු අතර, එයින් රු.149,274 ක් වටිනා මාළු දැල් පදනම වෙත ලබා දී තිබුණි. මේ අනුව රු.4,909,775 ක්වූ ඉතිරි අමුද්‍රව්‍ය 2011 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා ලැබිය යුතු දැ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එම ශේෂය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයේ විය. එමෙන්ම එම ශේෂය අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් පදනම විසින් ගෙන නොතිබුණු අතර අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් ද සිදුකර නොතිබුණි. | පුද්ගලික ආයතනයකින් ලැබිය යුතු රු.4,909,775 ක මුදල වසර 10කට වඩා පැරණි ශේෂයක් වන අතර මේ සම්බන්ධයෙන් ආයතනය තුළ මූලාශ්‍ර ලියවිලි නොමැති බැවින් අවශ්‍යය 2023 මූල්‍ය ප්‍රකාශණය තුළ අඩමාන ණය වෙන්කිරිමක් කිරිමට අවශ්‍ය ගිණුම්කරණමය ක්‍රියාමාර්ග ගැනිම සඳහා උපදෙස් ලබා දි ඇත. | දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කර තිබූ දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාල කාර්යයන් සීමාසහිත සී-නෝර් පදනම හරහා සිදුකරගෙන තිබුණු අතර ඒ වෙනුවෙන් පදනම වෙත ධීවර අමාත්‍යාංශයෙන් එකතුව රු.3,527,824 ක්වූ මුදලක් 2014 වර්ෂයේ සිට අයවිය යුතුව පැවතුණි. මෙම මුදල් අයවීම අවිනිශ්චිත තත්ත්වයේ වූ අතර ඒ වෙනුවෙන් අඩමාණ ණය සඳහා වෙන් කිරීමක් ද සිදුකර නොතිබුණි. | රඳවා ගැනිමේ මුදලක් වූ රු.3,527,823 ආපසු ලබා ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය ව්‍යාපෘති අංශය සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. | දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල අයකර ගැනීමට හෝ අඩමාණ ණය වෙන්කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අනෙකුත් ගෙවිය යුතු දෑ තුළ පෙන්නුම් කර තිබෙන වර්ෂ 06 කට අධික කාලයක් තිස්සේ පවතින රු.118,570 ක්වූ යාපනය වන්දි ගිණුමේ ශේෂය, ගෙවිය යුතු රඳවාගැනීම් ගිණුම තුළ වර්ෂ 11ට වැඩි කාලයක සිට පවතින රු.2,938,166 ක්වූ ආයතන 20 කට ගෙවිය යුතු ශේෂය, 2006 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නිරවුල් නොකර තිබෙන රු. 384,066 ක්වූ හිමිකම් නොපෑ වැටුප් සහ 2016 වර්ෂයේ සිට පවතින රු.412,620 ක්වූ හිමිකම් නොපෑ පාරිතෝෂික ශේෂයන්වල නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවිය. | 2023 මූල්‍ය ගිණුම් තුළ ගැලපීම් කිරීමට උපදෙස් ලබා දී ඇත. | දිගු කාලයක් තිස්සේ ගෙවිය යුතු මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ එකතු කළ අගය මත බදු සඳහා සලකා බලන සීමාවට ඇතුළත් නොවීම නිසා, සී-නෝර් පදනමේ එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිය 2021 වර්ෂයේ අක්‍රිය කර තිබුණි. එසේ වුවද සී-නෝර් පදනමේ ලෙජර් ගිණුම් අංක 2553 හි සඳහන් ගණුදෙනු විස්තර අනුව 2022 දෙසැම්බර් 31 දිනට සී-නෝර් පදනම විසින් මිලදී ගැනීම් මත ගෙවා තිබූ එකතුකළ අගය මත බදු රු.7,322,051 ක ශේෂයක් අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා තිබූ අතර, එම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | එකතු කල අගය මත බදු මුදල් ශේෂය පිළිබඳව දේශිය අදායම් දෙපාර්තමේන්තුවේ විමසිමක් කර 2023 මූල්‍ය ගිණුම් තුල නිවැරදි කිරිමට උපදෙස් ලබා දි ඇත. | |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සාංඝමික ව්‍යවස්ථාවලිය | | | |
| (i) | 53 ඡේදය | වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු බව දක්වා තිබුණ ද 2018,2019,2020 හා 2021 වර්ෂවල මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | සාංඝමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතුය. |
| (ii) | 58 ඡේදය | වාර්ෂික මහා සභා රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතු වුවත් සභාපතිවරයා පත්කිරීම ඒ අනුව සිදුකර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | සාංඝමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,690,121 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.4,248,596 ක ලාභයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,938,716 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 25 කින් එනම් රු. 30,167,673 කින් පහල යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 අනුපාත විශ්ලේෂණය**

(අ) පෙර වර්ෂය හා ප්‍රවර්තන වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය පිළිවෙලින් 1: 1.47හා 1: 1.43ක් විය. ප්‍රවර්තන වර්ෂයේ ගෙවිය යුතු දෑ රු. 10,470,424 කින් හෙවත් සියයට 10කින් අඩුවීම අනුපාතයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) පෙර වර්ෂය හා ප්‍රවර්තන වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1:0.6 හා 1:0.8 ක් විය. ප්‍රවර්තන වර්ෂයේ තොගය රු. 23,617,445 කින් හෙවත් සියයට 29 කින් අඩුවීම අනුපාතයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.13,046,567 ක් වූ වෙළඳ ණයහිමි ශේෂය තුළ දින 90 ට වඩා වැඩි රු.11,605,759 ක්වූ ණය හිමි කේවල ශේෂ 21ක් විය. මෙම ශේෂයන් අතුරින් එකතුව රු.379,086 ක්වූ ණයහිමි ශේෂයන් 02ක් වර්ෂ 05 සිට වර්ෂ 10 ක් දක්වා කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | වසර තුනක් දක්වා කාල විශ්ලේෂණයක් ගිණුම්කරණ පද්ධතිය මගින් ලබාගැනිමට හැකි අතර ඊට වැඩි කාලයක් දක්වා අවශ්‍ය වූ විට මැනුවල් (Manual) ගණනය කර ලබා ගත හැකිය. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අනෙකුත් ලැබිය යුතු ගිණුමේ බැංකු සුරකුම් ලෙස ගිණුම් ගත කර තිබූ රු.4,423,939 ක ශේෂය තුළ 2017 වර්ෂයේ කල්ඉකුත් වූ බැංකු සුරකුම් රු.1,221,893 ක් සහ කල්ඉකුත්වීම් විස්තර සඳහන් නොවූ 2017 වර්ෂයේ සිට පැවත එන බැංකු සුරකුම් රු.3,202,046 ක ශේෂ සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් ශේෂය ලබා ගැනීම සහ ගිණුම් ප්‍රකාශ ලබා ගැනීමට අදාළ අනුමත අත්සන් සහිත නිලධාරින් සේවයෙන් ඉවත් වී ගොස් ඇති අතර නව නිලධාරි පත්වීම් සමාගම් රෙජිස්ටාර් කාර්යාලයේ යාවත්කාලීන විය යුතු අතර එය යාවත්කාලින කිරිම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනිමින් පවති. ගිණුම් විස්තර ලබාගැනිමෙන් පසු 2023 මූල්‍ය ප්‍රකාශනයක් තුළ නිවැරදි කිරිමට උපදෙස් ලබා දි ඇත. | ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වසර 05කට අධික කාලයක් තිස්සේ පවතින රු.206,703 ක් වූ පෞද්ගලික ආයතනයකින් ලැබිය යුතු කුලී ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් අයකරගැනිමට හෝ අඩමාණ ණය වෙන්කරමින් අවශ්‍ය ගිණුම්කරණමය ගැලපීම සිදු කිරිමට උපදෙස් ලබා දෙන ලදී. | ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මට්ටක්කුලියේ පිහිටා තිබෙන පදනමට අයත් ගබඩා ගොඩනැගිල්ල 2022 මාර්තු 01 දින වනවිට මාසිකව රු.1,475,000 ක බදු කුලියක් මත බදුකරුවකු තෝරාගෙන තිබුණ ද, පදනම කුලී ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු නොකිරීම නිසා ඒ වන විට එම ගොඩනැගිල්ල භාවිතා කරමින් සිටි පුද්ගලික සමාගමටම 2022 සැප්තැම්බර් 30 දක්වා මසකට රු.1,175,000 ක මාසික බදු කුලියක් මත ගොඩනැගිල්ල භාවිතා කිරීමට අවසර ලබා දී තිබුණි. මේ අනුව නව බදු කුලි මිලගණන් යටතේ මාස 06 ක කාලය සඳහා පදනමට රු.8,850,000 ක බදු කුලී ආදායමක් සමාලෝචිත වර්ෂය සඳහා ලබාගත හැකිව තිබුණ ද, කුලී ගිවිසුම අත්සන් කිරීමේ කාල ප්‍රමාදය නිසා පදනමට ලැබී තිබුණේ රු.7,050,000 ක බදු කුලියක් පමණි. ඒ අනුව අදාළ කාලය සඳහා රු.1,800,000 ක බදු කුලි ආදායමක් පදනමට අහිමි වී තිබුණි. | නව තක්සේරු වටිනාකමට අනුව ලැබිය යුතු හිඟ බදු කුලිය 2023 වර්ෂයේ අය කරගැනිමට කටයුතු කර ඇත. | පදනමේ ආදායම වර්ධනය කරගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඉ) | 2016 වර්ෂයේ සිට පැවත එන කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණු එකතුව රු.30,321,343 ක ධීවර යාත්‍රා 02 ක් නිමි තොග තත්වයට පත් කිරිම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂයේ දී ද ගෙන නොතිබුණි. | අංක IMUL – A-0061-KMN සහ IMUL – A-0062-KMN දරන යන යාත්‍රා දෙක අප විසින් උප කොන්ත්‍රාත් පදනම යටතේ පෞද්ගලික ආයතනයට ලබා දී ඇති ඇනවුම් දෙකකි. නමුත් අදාළ ආයතනය මේ දක්වා එම යාත්‍රා දෙක සම්පූර්ණ කර නොමැත. එම නිසා කෙරීගෙන යන වැඩ තුළ අන්තර්ගත කර ඇත. | රජයට වාසිදායක වන පරිදි මෙම යාත්‍රාවල නිෂ්පාදන කටයුතු නිම කළ යුතුය. |
| (ඊ) | 2022 වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර තිබු 2020 වර්ෂයේ සිට පැවතෙන නිමකරන ලද ධීවර ආම්පන්න වලට අදාළ රු.4,732,169 ක තොගය විකිණීම හෝ අපහරණය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ද ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇණවුම් භාරදී නැවත රුගෙනයාමට නොපැමිණි අයිතම් කිහිපයක් ඇති අතර එම අයිතම් නව ගැණුම්කරුවන් සොයා විකිණීමට කටයුතු යොදවමින් පවතී. | පදනමට අවාසියක් නොවන පරිදි අදාළ තොග විකිණීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීමාසහිත සී-නෝර් පදනම විසින් නිෂ්පාදනය කළයුතු විවිධ අයිතමයන් නිශ්චිත වශයෙන් ප්‍රමාණයන් ද ඇතුළත්ව 2022 වර්ෂයේ ඉටුකළ යුතු ක්‍රියාකාරකම් 28 ක් හඳුනාගෙන තිබුණද, සැලසුම් කළ ක්‍රියාකාරකම් අතුරින් රු.මිලියන 149.35 ක් ඇස්තමේන්තු කර තිබු ක්‍රියාකාරකම් 15 ක් සඳහා කිසිදු මූල්‍ය ප්‍රගතියක් හෝ භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන නොතිබුණි. | ක්‍රියාකාරි සැලසුම්වල සඳහන් නිෂ්පාදනයන් සඳහා ඇනවුම් නොලැබීම නිසා මෙවැනි තත්ත්වයන් ඇති වී තිබේ. | ඇස්තමේන්තු කළ ක්‍රියාකාරකම්වල මූල්‍ය හා භෞතික ප්‍රගතියක් ලඟා කරගත හැකි පරිදි කටයුතු සැලසුම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රු.මිලියන 22.524 ක් ඇස්තමේන්තු කර 2022 දෙසැම්බර් 31 දිනට නිෂ්පාදනය කිරීමට සැලසුම් කළ අයිස් පෙට්ටි 40, ෆයිබර්ග්ලාස් ටැංකි 04 සහ තෙප්පම් 10 ක් සඳහා රු.මිලියන 6.78 ක වියදමක් දරා තිබුණ ද, ප්‍රමාණාත්මක භෞතික ප්‍රගතියක් ළඟා කරගෙන නොතිබුණි. | මාළු පෙට්ටි ටැංකි සහ තෙප්පම් නිෂ්පාදනය සඳහා යොදවා ඇත. | සැලසුම් කළ පරිදි භෞතික ප්‍රගතියක් ලබාගත යුතුය. |
| (ඇ) | රු.මිලියන 210.921 ක ඇස්තමේන්තුවක් යටතේ වර්ෂය පුරා ඉටුකිරීමට සැලසුම් කළ ක්‍රියාකාරකම් 7 ක් සඳහා රු.මිලියන 63.94 ක් වියදම් කර තිබුණ ද ක්‍රියකාරි සැලැස්ම අනුව එම ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය සියයට 75 කටත් වඩා අඩුවෙන් ළඟා කරගෙන තිබුණි. | අපේක්ෂිත නිෂ්පාදන හා ලැබෙන ඇනවුම්වල සැලකිය යුතු වෙනස්කම් පවතින අවස්ථාවල දී සැලසුම්වල ප්‍රගතිය අඩු මට්ටමක පවතී. | ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය ළඟාකර ගත යුතුය. |
| (ඈ) | දේශීය කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තයට අවශ්‍ය කරන ෆයිබර් ග්ලාස් ධීවර යාත්‍රා, බෝට්ටු, ඔරු,කොල්ලෑ සහ විවිධ ෆයිබර් ග්ලාස් නිෂ්පාදන හා ධීවර ආම්පන්න නිෂ්පාදනය සහ සංචාරක කර්මාන්තය සඳහා නවීන යාත්‍රා නිෂ්පාදනය සමඟ සමුද්‍රිය සේවා සැපයීම සීමාසහිත සී-නෝර් පදනමේ කාර්යයන් විය. ඒ අනුව විවිධ රාජ්‍ය ආයතන වෙත විකිණීම සඳහා 2022 වර්ෂයේ නිෂ්පාදනයන් 2473 ක් සිදුකිරීමට සැලසුම් කර තිබුණ ද නිෂ්පාදන 447 ක් පමණක් නිෂ්පාදනය කර තිබූ අතර භෞතික ප්‍රගතිය සියයට 18 ක් විය. සීමාසහිත සී-නෝර් පදනම විසින් ඉටුකිරීමට අපේක්ෂා කරන ෆයිබර් ග්ලාස් බෝට්ටු අපනයනයේ පිළිගත් අපනයන කරුවීම, ජාත්‍යන්තරයේ කීර්තිමත් ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයෙකු වීම, ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර බෝට්ටු සහ ෆයිබර් නිෂ්පාදන සැපයීම, විදේශ රටවල් තුළ ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයේ ආයෝජිතයෙකු වීම සහ විශිෂ්ඨ පාරිභෝගික සේවා සපයන්නෙකු වීම වැනි අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට මේ මඟින් නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | සැලසුම් කළ නිෂ්පාදනවල භෞතික ප්‍රගතිය ඉහළ මට්ටමක පවත්වා ගැනීම සහ ධීවර යාත්‍රා නිෂ්පාදනයේ විශිෂ්ඨ සේවා සපයන්නෙකුවීමේ අරමුණ ළඟා කරගත යුතුය. |
| (ඉ) | සීමාසහිත සී-නෝර් පදනමේ 2022 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව මට්ටක්කුලිය ගොඩනැගිල්ලේ වහලය සූර්යය ශක්ති විදුලි ජනක ව්‍යාපෘතිය සඳහා බදු දීම මත රු.මිලියන 2.4ක ආදායමක් ලබාගැනීමට සැලසුම් කර තිබුණ ද එහි කිසිදු භෞතික ප්‍රගතියක් නොතිබුණි. | අපේක්ෂිත පරිදි වහලය බදු දීමට නොහැකි විය. | පිරිවැයක් නොමැතිව ලබාගත හැකි ආදායම් පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතුය. |